# සිතෙහි දිග පළල

සිංහල බෞද්ධයන්ට කිවහැක්කේ මිනිසුන් ආදී සතුන් සම්බන්ධයෙන් චිත්ත මොළය ආශ්‍රිතව නොව හදවත හා රුධිරය ආශ්‍රිතව ඇතිවන බව ය. එහෙත් කිසිම අවයවයක් නැතිව ද බඹුන්ට චිත්ත ඇතිවන බව අප අමතක නොකළ යුතු ය. කෙසේ වෙතත් චිත්ත හා හෘදය වැනි අවයව පදනම් කරගෙන සත්ත්වයන් පිළිබඳ වර්ගීකරණයක් කළහැකි බව නම් පැහැදිළි වෙයි.

මනස පිළිබඳ සිංහල බෞද්ධ ප්‍රවාදයක් ගොඩනගාගැනීමේ දී සැලකිය යුතු කරුණු කිහිපයක් වෙයි. පළමුවෙන් ම ඒ ප්‍රවාදය ඌනිතවාදී නොවිය යුතු ය. එනම් මනස අවසනයේ දී එක් හේතුවක් පමණක් නිසා ඇතිවන්නක් යැයි නොගත යුතු ය. එමෙන් ම මනස ද්‍රව්‍යමය හෝ විකිරණමය හෝ වුවක් ද නොවිය යුතු ය. අයින්ස්ටයින් විද්වතාගේ $E=mc^2$ සමීකරණය හා ප්ලෑන්ක් විද්වතාගේ

E=mv සමීකරණය ඔස්සේ විකිරණය හා ද්‍රව්‍යය අතර ඇති සම්බන්ධය දැක්වෙයි. මෙහි m යනු ප්ලෑන්ක් නියතයෙන් ලබාගන්නා නියතයක් ද, v යනු විකිරණයෙහි සංඛ්‍යාතය ද වෙයි. ද්‍රව්‍යය ද විකිරණය ද ශක්තිය වෙයි. මනස් ඇත්තේ මිනිසුන්ට පමණක් නො වෙයි. මිනිසුන්ට, සත්ත්වයන්ට, දෙවියන්ට හා බඹුන්ට ද මනස් ඇත. දෙවියන්ට කෙසේ වෙතත් අරූපාවචර බ්‍රහ්ම ලෝකවල ජීවත්වන්නන් සම්බන්ධයෙන් ගත්විට මනස සම්බන්ධ කළ හැකි කාබනික හෝ අකාබනික හෝ සිරුරක් නැත. මිනිස් මොළයේ ක්‍රියාකාරකම් හා සිතන හෝ නො සිතන හෝ දේ අතර සම්බන්ධයක් තිබීමෙන් කියැවෙන්නේ මොළයේ ක්‍රියාකාරකම් හා සිතීම අතර සම්බන්ධයක් තිබෙන බව පමණකි. සිතන්නේ හෝ වේදනා විඳින්නේ මොළය හේතුවක් ලෙස සලකමින් නො වෙයි.

සිංහල බෞද්ධයන්ට අනුව මනස් ඇත්තේ මිනිසුන්ට පමණක් නො වෙයි. අනෙක් කාමාවචර සතුන්ට මෙන් ම බඹුන්ට ද මනස් ඇතැයි අපි දනිමු. එබැවින් මනස පිළිබඳ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි නිර්මාණය වන ප්‍රවාදයක බඹුන්ට ද මනස් ඇත්තේ කෙසේ ද යන්න තේරුම්ගත හැකිවිය යුතු ය. වෙනත් වචනවලින් කියන්නේ නම් ශරරයක් නැති අරූපාවචර බඹලොවෙහි මනසෙහි පැවැත්ම ද මනස පිළිබඳ සිංහල බෞද්ධ සංස්කෘතියෙහි ප්‍රවාදයකින් විස්තර කළ යුතු ව ඇත.

මනස යනු චිත්ත පරම්පරාවක් නම් හා බඹුන්ට ද චිත්ත ඇති වන්නේ නම් ඉන් කියැවෙන්නේ චිත්තයක් යනු අරූපාවචර වුවක් බව ය. කිසි ම භෞතික ශරරයක් නැති ව වුව ද චිත්ත ඇතිවීමට හැකි ය. එහෙත් මිනිසකුගේ හෝ වෙනත් සතකුගේ චිත්ත මොළයේ හෝ හදවත හෝ රුධිරය හෝ ආශ්‍රිතව ඇතිවන්නේ යැයි යමකුට කියනු හැකි ය. කෙසේ වෙතත් බටහිර විද්‍යාවෙහි ඉගැන්වෙන්නේ මොළය ආශ්‍රිත ව චිත්ත ඇතිවන බව නො ව මොළය නිසා චිත්ත ඇතිවන බව ය. මොළය නිසා චිත්ත ඇතිවීම හා මොළය ආශ්‍රිතව චිත්ත ඇතිවීම යනු එකක් නො ව දෙකක් ය.

සිංහල බෞද්ධයන්ට කිවහැක්කේ මිනිසුන් ආදී සතුන් සම්බන්ධයෙන් චිත්ත මොළය ආශ්‍රිතව නොව හදවත හා රුධිරය ආශ්‍රිතව ඇතිවන බව ය. චන්න ජයසුමන මහතා උත්සාහ ගෙන ඇත්තේ ඒ එසේ බව පෙන්වීමට ය. එහෙත් කිසිම අවයවයක් නැතිව ද බඹුන්ට චිත්ත ඇතිවන බව අප අමතක නොකළ යුතු ය. කෙසේ වෙතත් චිත්ත හා හෘදය වැනි අවයව පදනම් කරගෙන සත්ත්වයන් පිළිබඳ වර්ගීකරණයක් කළ හැකි බව නම් පැහැදිලි වෙයි.

චිත්තයක් පාදයක මහපටැඟිල්ලෙහි සම ආශ්‍රිතව ද ඇති විය හැකි බව චන්න ජයසුමන මහතා සඳහන් කර ඇත. ඉදිකටුවකින් මහපටැඟිල්ලට ඇන්නොත් අපට ඒ දැනෙයි. අපට ඒ පිළිබඳ චිත්ත ඇතිවෙයි. කෙසේ වෙතත් එවැනි චිත්තයක් ඇතිවන්නේ සිරුර ආශ්‍රිතව ය. එහෙත් ඒ නිසා ම මනස ඇත්තේ ශරරයෙහි ය යන නිගමනයට අප නොපැමිණිය යුතු ය. මනස අරූපාවචර ය. ඒ ඇතැම්විට සිරුරෙන් බාහිරව වුව ද පැවතිය හැකි යැයි විශ්වාස කිරීමට සිංහල බෞද්ධයනට බාධාවක් නැත.

© Prof. Nalin De Silva

අපට ගසක හෝ වැලක හෝ ඇති මලක් පෙනෙන්නේ කෙසේ ද? බටහිර විද්‍යාවට අනුව මලෙන් ලැබෙන ආලෝක කිරණ ඇසේ කාචය ඔස්සේ දෘෂ්ටි විතානයට යයි. ඒ සමග ස්නායු හා මොළය ක්‍රියාත්මක වී අපට මල පෙනීමට සලස්වයි. මෙහි දී මල අපෙන් බාහිර ව ඇති වස්තුවක් ලෙස සැලකෙයි. එහෙත් එසේ බාහිර ව හා අභ්‍යන්තරව යනුවෙන් ලෝකය බෙදීම ම ප්‍රශ්නයක් වෙයි. මල යන්න අපට පෙනෙන්නේ චක්ඛු විඤ්ඤාණය ඇතිවීමෙන් ය. අනිත්‍ය, දුක්ඛ, අනාත්ම නොතේරෙන බැවින් මල යන්නෙන් දෙයක් (වස්තුවක්) නිර්මාණය කෙරෙන්නේ අප විසින් ම ය. එහෙත් මෙහි දී ඇස යන ඉන්ද්‍රිය ක්‍රියාකාරී විය යුතු බව අමුතුවෙන් කිවයුතු නො වෙයි. එමෙන් ම ස්නායු පද්ධතිය ද ක්‍රියාත්මක විය යුතු ය. ඇසෙහි යම් අඩුවක් තිබුණ හොත් අපට මල මුළුමනින් ම හෝ මලෙහි කොටසක් හෝ නොපෙනී ගිය හැකි ය.

බඹකුට ඒ ක්‍රියාවලිය එසේ සිදු නො වෙයි. බඹකුට අප මලක් සේ දකින්න කෙසේ ගෝචරවන්නේ දැයි අපි නොදනිමු. මනස හැරෙන්නට වෙනත් ඉන්ද්‍රිය පද්ධතියක් නොමැතිව බ්‍රහ්මයෙක් "මල දකියි" යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? අපට ඉන්ද්‍රිය පද්ධතියක් අවශ්‍ය වන්නේ ම අපේ මනස දියුණු නොමැති බැවින් විය හැකි ය. අනෙක් අතට මනස ඉතා ම අඩු ප්‍රමාණයකින් වර්ධනය වී ඇති සත්ත්වකුට මිනිසකුගේ වැනි ඉන්ද්‍රිය පද්ධතියක් අවශ්‍ය නො වනවා විය හැකි ය. වෙනත් වචනවලින් කියන්නේ නම් එවැනි ඉන්ද්‍රිය පද්ධතියක් තිබුණ ද ඒ සත්ත්වයාට ඉන් වැඩක් නැතිවනවා විය හැකි ය. මනස වර්ධනය වන්නාත් සමග වර්ධනය වූ ඉන්ද්‍රිය පද්ධතියක් අවශ්‍ය වන නමුත්, ඇතැම් අවස්ථාවල ඉන්ද්‍රිය පද්ධතියෙන් බාහිරව ද මනස ක්‍රියාත්මක වන බව පෙනෙයි.

බඹුන්ට මනස ක්‍රියාත්මක වීම සඳහා වෙනත් ඉන්ද්‍රිය අවශ්‍ය නො වෙයි. එමෙන් ම මිනිසුන්ට ද මනස තවත් වර්ධනය කරගත හැකිනම් අනෙක් ඉන්ද්‍රිය පද්ධතිය නැතිව ද ලෝක නිර්මාණය කරගත හැකි ය. අභිඥා උපදවා ගත් අය පමණක් නො ව කලා නිර්මාණ, සංකල්ප හා ප්‍රවාද නිර්මාණ කරන්නන් ද තම තමන්ගේ නව කෘති නිර්මාණය කිරමේ දී මනස පමණක් ආධාර කරගන්නා බව පෙනෙයි. එහෙත් මනස නොමැතිව කිසිවක් නිර්මාණය කිරමට නො හැකි ය. මෙයින් කියැවෙන්නේ මනස වර්ධනය වන්නාත් සමග වර්ධනය වූ ඉන්ද්‍රිය පද්ධතියක් අවශ්‍ය නමුත් ඒ යම් ප්‍රමාණයකට වර්ධනය වූ පසු වෙනත් ඉන්ද්‍රියක් අවශ්‍ය නොවන්නේ ය යන්න ය.

එක් ක්‍ෂණයක දී ඇතිවන්නේ එක් චිත්තයක් පමණ ය. ඒ චිත්තය ඇති වී නැති වී යැමත් සමග වෙනත් චිත්තයක් ඇති වෙයි. එසේ වීමේ දී පළමු චිත්තයට අවසානයේ දී වූ තොරතුරු දෙවැනි චිත්තයට ලැබෙයි. මතක යන්නෙන් අප හඳුන්වන්නේ එලෙස චිත්තයකට ලැබෙන තොරතුරු කැඳවීමට චිත්තයට ඇති හැකියාව ය. දැන් අපි චිත්තයක් පිළිබඳ ප්‍රශ්නයක් අසමු. චිත්තය යන්න අරූපාවචර යැයි අපි ගනිමු. චිත්තයේ වපසරිය කුමක් ද? ඒ දිගින් හා පළලින් කොපමණ වෙයි ද?

ඒ ප්‍රශ්නය වැරැදි බව මේ වන විට පැහැදිලි විය යුතු ය. දිගක් හා පළලක් තිබිය හැක්කේ අඩු ම තරමින් රූපාවචර දෙයකට ය. චිත්තයක වපසරිය හෝ දිග පළල ගැන කතා කළ නොහැක්කේ චිත්තයක් අරූපාවචර වන බැවින් ය. චිත්තයක තොරතුරු ගබඩා කිරමට මොළයක් හෝ වෙනත් අවයවයක් හෝ අනවශ්‍යය. ද්‍රව්‍යමය හෝ විකිරණමය ලෝකයක් නොමැතිව තොරතුරු ගබඩා කිරමක් කළ හැකි බව විශ්වාස කරමු. චිත්තයකට දිගක් පළලක් ගැන කතා කිරමට නොහැකිකම ද හේතුවෙන් මිනිසකු සම්බන්ධයෙන් චිත්තයක් ඇතිවන්නේ මිනිසකුගේ ශරරාභ්‍යාන්තරයෙහි ද බාහිර ද යන ප්‍රශ්නය වැදගත්කමක් නැතැයි සිතෙයි.

මිනිසකුගේ චිත්තයක් ශරරාභ්‍යන්තරයෙහි මෙන් ම පිටත ද විය හැකි ය. අප මලක් දකින විට චිත්තය මල ද ඇසුරු කරයි. මල නිර්මාණය කෙරෙන්නේ ම චිත්තය විසින් ය. ඉදිකටුවකින් සමට ඇන්න විට චිත්තය ඇති වීමේ දී ඉදිකටුවෙන් අනිනු ලැබූ තැන වැදගත් වන්නා සේ ම මලක් දැකීමේ දී චිත්තය ඇතිවන්නේ මලෙහි ද යනුවෙන් ද ගත හැකි ය. ඉන් අදහස් වන්නේ අදාළ චිත්තය මලෙහි පමණක් ඇති වන බව නො වෙයි. චිත්තය මලෙහි මෙන් ම හදවතෙහි ද ඇතිවන්නේ යැයි කිව හැකි ය. චිත්තය එක් තැනකට, ලක්‍ෂ්‍යයකට, පමණක් කොටු කිරම කළ හැකි නො වෙයි.

© Prof. Nalin De Silva

එහෙත් ඉන් අදහස් වන්නේ චිත්ත ඒකාග්‍රතාවක් ඇති කර ගැනීමට නොහැකි බව නො වෙයි. චිත්ත ඇති වන නැති වන බව අපි දනිමු. ඒ එක් චිත්තයක් අවකාශයෙහි එක් ලක්ෂ්‍යයක පමණක් කොටු කර ගැනීමට නොහැකි වීම එකකි. චිත්ත ඒකග්‍රතාවක් නැති වීම යනු තවත් එකකි. අප මේ ක්ෂණයෙහි මලක් ග්‍රහණය කරගන්නා අතර ඊළඟ ක්ෂණයෙහි මල් පැළය ද ඉන් පසු සමනළයකු ද ග්‍රහණය කරගන්නවා විය හැකි ය. චිත්ත ඒකග්‍රතාවක් නැත්තේ එවැනි අවස්ථාවල ය. අපට දිගින් දිගට ම මල ගැන පමණක් සිතන්නේ නම්, එනම් මල ගැන පමණක් චිත්ත ඇති කරගන්නේ නම් එතැන චිත්ත ඒකග්‍රතාවක් ඇති වෙයි. අපි එහි දී සිත එකඟ කරන්නේ යැයි කියමු.

මේ එකග කිරමක් මිස එකඟ කිරමක් නොවන්නේ යැයි සිතමි. සිත එකග කිරම යනු එක අගකට සිත ගෙන ඒම ය. එනම් චිත්ත ඒකග්‍රතාවක් ඇති කර ගැනීම ය. එකඟ කිරම තවත් යමක් සමග එක ම අදහසකට පැමිණීම ය. ඇතැම් විට සිත පසුව එන සිතත් සමඟ එකග වන්නේ ය යන අරුතින් සිත එකඟ කිරමක් ගැන කතා කරනවා විය හැකි ය. කෙසේ වෙතත් ඒ විමසා බැලිය යුත්තකි. ඇතැම් විට ඒ දෙකෙන් ම කියැවෙන්නේ එකක් ම විය හැකි ය.

කෙසේ වෙතත් එකග කළ සිතක් වුවත් අවකාශයෙහි එක් ලක්ෂ්‍යයකට පමණක් කොටු කළ නොහැකි ය යන්න මෙයින් ලබාගත හැකි නිගමනය වෙයි. චිත්තයක් මොළයේ එක් ප්‍රදේශයකට සවි කරන ඉලෙක්ට්‍රෝඩයකට සීමා කිරම විහිළුවක් වෙයි. යම් චිත්තයක් ඇති වීමේ දී මොළයේ යම් ප්‍රදේශයක උත්තේජනයක් ඇති නො වන්නේ යැයි මෙයින් නො කියැවෙයි. චිත්තයක් ඇතිවන විට මොළයේ යම් ප්‍රදේශයක උත්තේජනයක් ඇතිවීම එකකි. මොළයේ ඒ ඒ ප්‍රදේශවලින් චිත්ත ඇති වීම තවත් එකකි.

මොළයේ ඒ ඒ ප්‍රදේශවල ඇතිවන උත්තේජන ඔස්සේ සිත් කියවීමට කරන උත්සාහයක් පිළිබඳ ව පසුගිය සතියෙහි නිව් සයන්ටිස්ට් සඟරාවෙහි පළ වුණි. ඉන් යම් සාර්ථකත්වයක් ලබාගැනීමට නොහැකි යැයි මම නො කියමි. ඒ ඒ චිත්ත හා චිත්ත ඇතිවන විට මොළයේ උත්තේජනය වන ප්‍රදේශ අතර අනුරූපිතාවක් ගොඩනගාගැනීමට හැකි නම්, යම් ප්‍රමාණයකට සිත් කියවීමට ඒ අනුරූපීතාව යොදාගත හැකි ය. එමෙන් ම ඒ ඒ චිත්ත ඇති වන විට නාඩි වැටෙන රටාව දැනගැනීමෙන් ද එවැනි අනුරූපීතාවක් ගොඩනගාගැනීමට හැකි වනු ඇත. එසේත් නැත හොත් ඒ ඒ චිත්ත සමග ශරරයෙහි රැස්වළල්ල වෙනස්වීම අධ්‍යයන කර ද සිත් කියවීම සඳහා අනුරූපීතාවක් ගොඩනගා ගැනීමේ ඉඩකඩ වෙයි. සිත දියුණු කිරමෙන් ද ඒ හැකියාව ලබාගත හැකි බව අපි දනිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva